880

කැලණිය විශ්වවිද්‍යාලය

ශ්‍රී ලංකාව

# "කෘෂිකාර්මික ඉඩම් පරිහරණය කෙරෙහි ඉඩම් අයිතියේ සහ භුක්තියේ බලපෑම

## (මහවැලි 'එච්'කලාපය ඇසුරින්)"

නම: එම්. එම්. එස්. ඒ. මාරසිංහ

විභාග අංකය: **FGS/ G/ MSSc/ 2006/ 08**

භූගෝලවිද්‍යා අධ්‍යයන අංශය

FACULTY OF GRADUATE STUDIES
19 JUN 2014
UNIVERSITY OF KELANIYA

| ප්‍රවේශ අංකය: | 880 |
|---|---|
| වර්ග අංකය: | |

කැලණිය විශ්වවිද්‍යාලය මගින් පවත්වනු ලැබූ සමාජීය විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලාවේ (භූගෝල විද්‍යාව) පර්යේෂණ අවශ්‍යතාවක් වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන ස්වාධීන පර්යේෂණ නිබන්ධනයකි.

2013 මාර්තු

*කෘෂිකාර්මික ඉඩම් පරිහරණය කෙරෙහි ඉඩම් අයිතියේ සහ භුක්තියේ බලපෑම: මහවැලි 'එච්' කලාපය ඇසුරින් අධ්‍යයනයක්*


## සංක්ෂිප්තය

ඈත අතීතයේ සිටම මිනිස් වර්ගයාගේ පැවැත්මටත්, ඉදිරි ගමනටත් තීරණාත්මක සාධකයක් වූයේ භූමියයි. මේ නිසා ඉඩම් සම්බන්ධ ගැටළු හා ප්‍රතිපත්තීන් කාලය, දේශය, සහ සමාජ ආර්ථික ක්‍රම අතර ඇති වෙනස්කම් නොසලකමින් එදා මෙදා තුර මානව සමාජයේ කේන්ද්‍රීය ස්ථානයක් අත්පත් කරගෙන ඇත. ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාව මිලියන 20 කි. භූමි ප්‍රමාණය ගත් විට අක්කර මිලියන 16 කි. ඒ නිසාම මිනිස් බිම් අනුපාතිකය ( Man Land Ratio) ශීඝ්‍රයෙන් පහත වැටී ඇත. 1830 දි හෙක්ටයාර් 6. 83 වන මිනිස් බිම් අනුපාතිකය 2001 වන විට හෙක්ටයාර් 0.31 දක්වා අඩුවී ඇත. ඒ පිළිබඳ ඇති අනෙක් සාධකය වන්නේ රටේ මුළු භූමි ප්‍රමාණයෙන් 82.34% ක් යම් ආකාරයකින් තවමත් රාජ්‍යය පාලනය යටතේ පැවතීමයි. මෙම තත්ත්වයන් නිර්මාණය වීම සඳහා යටත් විජිත යුගයේ පැවති ඉඩම් ප්‍රතිපත්තීන් හා 1972 -1975 කාලය තුළ සිදු කරන ලද ඉඩම් ප්‍රතිපත්ති හේතු වී ඇත. මේ නිසාම ජනතාවට ඉඩම් පිළිබඳ ගැටළුකාරි තත්ත්වයක් මතු වී ඇත. ජනතාවගේ ජිවන තත්වය උසස් කිරීම සඳහා 1935 හා 1985 කාලය තුළ රජයට අයිති ඉඩම් අක්කර මි. 2.29 ක් ඉඩම් අහිමි පවුල් අතර බෙදා දීමක් ද සිදු කර ඇත. නමුත් ජන සංඛ්‍යාව වැඩි වීමත් සමඟ භූමිය සඳහා වන ඉල්ලුම වැඩිවෙමින් පවතී. මේ අනුව භිග සම්පත් සපුරා ගැනීමේ දී විවිධ දුශ්කරතාවන්ට මුහුණ දීමට සිදුවේ.

මෙම අධ්‍යයනයේදි මතුවන ප්‍රධාන අධ්‍යයන ගැටළුව වන්නේ කෘෂිකාර්මික ඉඩම් පරිහරණය කෙරෙහි අයිතිය සහ භුක්තිය බලපාන ආකාරය සොයා බැලීම වේ. එසේම එම ඉඩම්වල අයිතිය සහ භුක්තිය හේතුවෙන් නිර්මාණය වන විවිධ ගැටලු සොයා බැලිමත් වේ. මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණු වන්නේ ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම් පරිහරණයේ ස්වරූපය හඳුනා ගැනීම සහ ඊට බලපා ඇති සාධක හඳුනා ගැනීමත්, ඉඩම් අයිතියේ සහ භුක්තියේ ප්‍රමාණය කෙතෙක් දුරට කෘෂිකාර්මික ඉඩම් පරිහරණය කෙරෙහි බලපා තිබේද යන්න සොයා බැලීමත්ය. අධ්‍යයන ප්‍රදේශය වශයෙන් මහවැලි 'එච්' කලාපයේ ගල්නෑව කලාපය තොරාගත් අතර එයිනුත් ඉඩම් සම්බන්ධ ගැටලු බහුලව දක්නට ලැබෙන බුල්නෑව කලාපය තුල සිටන ජනගහනයෙන් 7%ක නියදියක් මේ සඳහා භාවිත කරන ලදි. එහිදි

සසම්භාවි නියදියට අනුව ප්‍රශ්ණාවලියක් භාවිතා කොට  අවශ්‍ය තොරතුරු පම්පාදනය කරගන්නා ලදි.

ප්‍රශ්ණාවලිය භාවිතා කොට ලබාගත් පර්යේෂණ ප්‍රතිඵල අනුව පෙනියන්නේ මෙම ප්‍රදේශය තුල කෘෂිකාර්මික ඉඩම් පරිහරණය කෙරෙහි සෘජු වශයෙන්ම ඉඩම් අයිතිය සහ භුක්තිය බලපාන බවයි. ඒවගේම අතීතයේ සිට වර්තමාණය දක්වා ඉඩම් අයිතිය සහ භුක්තිය ක්‍රමක්‍රමයෙන් වෙනස් වි ඇති අතර සින්නක්කර සහ රජයේ ඉඩම් හැරුණුකොට අද, බද්ද, අනවසර, නියමානුකූල නොකරන ලෙස ඉඩම් භුක්ති ක්‍රම නිර්මාණය වී තිබිණි. මීට අමතරව ඉඩම් අයිතිය සහ භුක්තිය ප්‍රධාන වශයෙන් කෘෂිකාර්මික ඉඩම් පරිහරණයට බලපෑම් සිදුකරන අතර ප්‍රදේශය පුරා සමාජ, ආර්ථික, පාරිසරික ගැටළු රාශියක් නිර්මාණය කර ඇත. මෙම තත්ත්වයන් මැඩ පැවැත්වීම සඳහා මහවැලි සංවර්ධන කලාපය තුල කාර්යක්ෂම ඉඩම් පරිහරණ නිති රීති හඳුන්වා දිය යුතුව පවති.

**Key words :** අයිතිය, භුක්තිය, අද, *ඉඩම් කැබලිවීම,*